www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජනාධිපති රාජ්‍ය අංශයේ කම්කරුවන් මැඩීමේ පොලීසිය ලෙසට සමිති නායකයන් බඳවා ගනී

## Sri Lankan president recruits union leaders to police public sector workers

**විලානි පීරිස් විසිනි**
**2006 අප්‍රේල් 22**

ගිය මස රාජ්‍ය අංශයේ එක් දින වැඩ වර්ජනයෙන් හුදු සතියකින් අනතුරුව ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ ආන්ඩුවේ ප්‍රධාන අමාත්‍යාංශවල අලුතෙන් ඇති කරන ලද වෘත්තීය සමිති සම්බන්ධීකරන ලේකම් තනතුරු සඳහා සමිති නායකයන් 21 දෙනෙකු බඳවා ගත්තේ ය. ඔවුන්ගේ රාජකාරියට ආන්ඩුව ආරක්ෂා කිරීම -- වෙනත් වචනවලින් නම් සැලකියයුතු තරමේ වැටුප් ඉහල දැමීම් සඳහා වන ව්‍යාපාරයට වල කැපීම හා කඩා කප්පල් කිරීම -- අවශ්‍ය බවට පැහැදිලි සඳහනක් ඇතුලත් වෙයි.

1980 පසු ඇතිවූ රාජ්‍ය අංශ සේවකයන්ගේ පලමු විශාල කාර්මික ක්‍රියාව වූ එක් දින වර්ජනය පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) සොලවා දැමී ය. මාර්තු 16 වන දා 300,000 තරම් කම්කරුවෝ ආන්ඩුවට හිතවත් සමිති සිය සාමාජිකයන් ඊට එක් වීම වැලැක්වීමට ගත් වැර වෑයම තිබියදී ම වැඩ වැරූහ. වැඩ වර්ජනය කැඳෙව්වේ 200ක් තරම් ස්වාධීන සමිති එක් වීමෙන් තැනුනු රාජ්‍ය අංශයේ වැටුප් විමර්ශනය සඳහා වන වෘත්තිය සමිති කමිටුව (පීආර්එස්එස්ටීයූසී) ය.

පසු ගිය නොවැම්බරයේ ජනාධිපතිවරනය යාන්තමින් ජය ගත් රාජපක්ෂ රාජ්‍ය අංශයේ ක්‍රියාවට අනෙකුත් කම්කරුවන්ගේ හා ගම්බද දුගීන්ගේ සහාය ලැබේ යයි කනස්සලු විය. කම්කරු ජනයා අතර දැනටමත් විශේෂයෙන් ම ඉන්ධන හා ගමනා ගමනයේ වැඩිවන මිල ගනන් ගැන මෙන් ම රැකියා හා ජීවන තත්වයන් මත ආන්ඩුවේ ආර්ථික ප්‍රතිව්‍යුහගත කිරීම්වල බල පෑම මත ද පුලුල්ව පැතිරුනු කෝපයක් හා අතෘප්තියක් තිබේ.

පීආර්එස්එස්ටීයූසී නායකයන් තමන්ගේ සාමාජිකයින්ට මාර්තු 30 වන දා පලාත් පාලන ඡන්දය දීමෙන් වැලකීමට යෝජනා කල විට ඔවුන්ට "වගකීම් විරහිත" බව පිලිබඳව ප්‍රසිද්ධියේ පහර දෙමින් රාජපක්ෂ කෝපයෙන් ප්‍රතික්‍රියා දැක්වී ය. මාර්තු 22 වන දා ඔහු එජනිසයට අනුබද්ධ වෘත්තීය සමිති නායකයන්ගේ රැස්වීමක් කැඳවා සම්බන්ධීකරන ලේකම් තනතුරු 21ක් ඇති කිරීම ඉදිරිපත් කලේය. පැමින සිටියවුන් අතර රාජපක්ෂගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ට මෙන් ම ලංකා සමසමාජ පක්ෂය (ලසසපය) ට හා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය (ශ්‍රීලකොප) ට අනුබද්ධ සමිතිවලින්ද නියෝජිතයෝ වූහ.

රැස්වීම සංවිධානය කලේ ජනාධිපතිවරන ව්‍යාපාරය තුල දී රාජපක්ෂ වෙනුවෙන් ක්‍රියා කල ශ්‍රීලකොප නායකයකු හා රාජ්‍ය සේවා වෘත්තීය සමිති සම්මේලනයේ නිලධරයෙකු වූ ඩබ්ලිව්. එච්. පියදාස ය. ඔහුට ඒ වන විටත් අතිවිශාල වැටුපක් සේම නිල රථයක් හා රියදුරකු සමග රජයට අයත් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂක ධුරයෙන් කුලිය ගෙවා තිබුනි. රාවය පුවත්පතට අනුව සම්බන්ධීකරන ලේකම්වරුන්ට ආරම්භක වැටුප ලෙස සාමාන්‍ය කම්කරුවෙකුගේ වැටුප මෙන් තුන් හතර ගුනයක් වූ ආන්ඩුවේ පරිපාලන නිලධාරියකුගේ වැටුප - රු.23,750ක් - ලැබෙනු ඇත.

රාජපක්ෂ සමග හමුව පැවැත්වූ දිනට පසු දා පියදාස සහ ශ්‍රීලනිප සමිති නායක අලෙවි මච්ලානා ඡන්දය වර්ජනය කිරීමේ පීආර්එස්එස්ටීයූසී කැඳවුමට විරෝධය පෑමට නිපොන් හෝටලයේ ඒකාබද්ධ ප්‍රවෘත්ති සාකච්ඡාවක් පැවැත්වී ය. පියදාස, "අප කම්කරුවන් ලෙස කම්කරුවන්ගේ පූර්න සහයෝගයෙන් බලයට ගෙන ආ මේ ආන්ඩුව පෙරලා දැමීමට ක්‍රියා කරන්නේ නැත". යනුවෙන් විලිලැජ්ජා නැතිව රාජපක්ෂ සහ එජනිස ආරක්ෂා කලේ ය. ඔවුන්ගේ සමිති අප්‍රේල් 3 වන දා වූ පීආර්එස්එස්ටීයූසීයේ ඊ ලග විරෝධතාවයට සහාය දීම ප්‍රතික්ෂේප කලෝ ය.

සම්බන්ධීකරන ලේකම් තනතුරු ගනනාවක් දැනටමත් පුරවා හමාර ය. ලංකා කම්කරු සම්මේලනයේ ලේකම් හා ලසසප උප ලේකම් ජගත් හේමචන්ද්‍ර විද්‍යා හා තාක්ෂන අමාත්‍යාංශයට පත් කර තිබේ. ශ්‍රී ලංකා නිදහස් ආන්ඩුවේ වෘත්තීය සමිති සම්මේලනයේ ටියුඩර් රනසිංහ ආපදා කලමනාකරන අමාත්‍යාංශයට පත් කර තිබේ.

තමන්ට "දිගු රාජකාරී ලැයිස්තුවක්" තිබෙන බව ලෝසවෙඅ ට ප්‍රකාශ කල රනසිංහ ඉන් එකක් "ආන්ඩුව ආරක්ෂා කිරීම" බව ද පිලිගත්තේ ය. මෙයට අමාත්‍යාංශ

තුල විශේෂයෙන් ම "යම් හෝ වැඩ අවුල් කරන ක්‍රියා" ඇතුලු කම්කරුවන්ගේ දේශපාලන කටයුතු පිලිබඳව වාර්තා කිරීම ඇතුලත් ය. ඔහු වැඩේ බාර ගැනීම යුක්ති සහගත කලේ පෙර වූ එක්සත් ජාතික පක්ෂ ආන්ඩුවේ එවැනි තනතුරු 64ක් තිබූ බව කියමිනි.

නව තනතුරු ලබා ගත් අය අතරට, ආන්ඩුවේ කම්කරු සම්මේලනයේ ලේකම් ඩී. එම්. අබේරත්න, දුම්රිය අමාත්‍යංශයට, ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සමිතියේ ලේකම් ඩී.සී. වීරරත්න අග්‍රාමාත්‍ය කාර්යාලයට, හේමසිරි ජයලත් ජනාධිපති ලේකම් කාර්යාලයට සහ ශ්‍රී ලංකා ආන්ඩුවේ වෘත්තීය සමිති සම්මේලනයේ බන්දු ජයසිංහ සෞඛ්‍ය අමාත්‍යාංශයට ද අයත් වෙයි.

මෙම රජයට සහාය දෙන වෘත්තීය සමිති දැන් කම්කරුවන්ට සිය උද්ඝෝෂනය නවතන ලෙසටත් රාජපක්ෂ පත් කල අලුත් වැටුප් කොමිසමේ වාර්තාව ලැබෙන තුරු බලා සිටින ලෙසටත් කියා සිටියි. කෙසේ වෙතත් ප්‍රතිපත්තිවලට අනුව වාර්තාව මේ වසරේ අයවැය යෝජනාවන්ට අනුකූල විය යුතුය. එහි ප්‍රතිඵලයක් ලෙස අලුත් යෝජනා කම්කරුවන් විසින් දැනටමත් ප්‍රතික්ෂේප කර තිබෙන ඒවාට වඩා සැලකියයුතු අයුරකින් වෙනස් විය නොහැක. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හා ලෝක බැංකුවේ ඉල්ලීම් අනු යමින්, රාජ්‍ය අංශයේ වැටුප් ඵලදායිතා ඉලක්කවලට රාජ්‍ය අංශයේ රැකියා සංඛ්‍යාවේ "යලි විමර්ෂනයට" ගැට ගැසෙනු ඇත.

සම්බන්ධීකරන ලේකම්වරුන් ලෙස පත් කල නිලධාරීන් 21 දෙනා මෙම ප්‍රතිපත්තීන් ක්‍රියාවට දැමීමේදී ආන්ඩුවේ දේශපාලන පොලිස්කාරයන්ගේ මට්ටමින් ක්‍රියාත්මක වනු ඇත. මෙවන් තනතුරු බාරගැනීමට ඔවුන්ගේ ඇති කැමැත්ත වෘත්තීය සමිතිවල පිරිහීයාමේ සහ දැන් ශ්‍රීලනිපයේ සුවච සේවකයන්ට වඩා වැඩි යමක් නොවන ලසසපයේ හා කොපයේ දේශපාලන පරිහානියේ තවත් දර්ශකයකි.

මෙම තනතුරු ඇති කිරීමේ රාජපක්ෂගේ තීරනය මංමුලා සහගත බවේ සලකුනකි. මෙම සමිති නිලධරයට ඔවුන්ට පැවරූ භූමිකාව ඉටු කිරීමේ ශක්තියක් තිබේ ද යන්නට කිසිදු සහතිකයක් නැත. මාර්තු 16 එක් දින වර්ජනයේ දී මෙන්ම අප්‍රේල් 3 විරෝධතාවයේදී ආන්ඩුවට සම්බන්ධිත සමිතිවල බොහෝ සාමාජිකයෝ ඔවුන්ගේ නිලධාරීන් නොතකා උද්ඝෝෂනයට එක් වූහ. ස්වාධීන හෝ පක්ෂවලට අයත් නැති වෘත්තීය සමිති මතු වී ඒම මත් පැරනි සමිතිවල නායකත්වයන් පිලිබඳව කම්කරුවන්ට දැනෙනා පිලිකුලේ හා වෛරයේ නිෂ්පාදිතයකි.

පීආර්එස්එස්ටීයූසී නායකයන් සීමිත වැටුප් උද්ඝෝෂනයක් සංවිධානය කල ද ඔවුන් ආන්ඩුවට එරෙහිව දේශපාලන ප්‍රහාරයකට සූදානම් නැත. පීආර්එස්එස්ටීයූසී කැඳවුම්කරු සමන් රත්නප්‍රිය *ලෝසවෙඅට* ප්‍රකාශ කලේ කමිටුව තව දුර ක්‍රියා මාර්ග ගැනීමට ප්‍රථම ආන්ඩුව නව යෝජනා ගෙනෙන තුරු බලා සිටින බව ය. අලුතෙන් පත් කරන ලද සම්බන්ධීකරන ලේකම්වරු ගැන විමසූ විට ඔහුගේ ආකල්පය වූයේ අපි ජීවත් වෙමු ඔවුන්ටත් ජීවත් වෙන්න හරිමු යන්න ය. "ඒක එයාලගේ කැමැත්ත. අපිට ඒවයින් වැඩක් නෑ. ඒත් අපි අරගලය දිගට ගෙන යනවා." යයි ඔහු පැවසී ය.

යථාර්ථයෙන් නම් සමිති නිලධරය ඇටවීමේ රාජපක්ෂගේ තීන්දුව ඔහුගේ ආන්ඩුවට රාජ්‍ය අංශයේ කම්කරුවන්ට කිසිදු සැලකියයුතු වැටුප් වැඩිවීමක් දීමට උවමනාවක් නැති බවත් තමන්ගේ අලුත් කාර්මික පොලීසියේ උදව්ව ඇතිව කම්කරු පන්තියට එරෙහිව කුරිරු ප්‍රති ප්‍රහාරයක් දියත් කිරීමට සූදානම් වන බවත් පිලිබඳව තව දුරටත් අනතුරු ඇඟවීමකි.

© www.wsws.org